**වවුනියාව මහානගර සභාව - 2024**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වවුනියාව මහානගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වවුනියාව මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහානගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහානගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහානගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහානගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. 16,731,474 ක් වටිනා ව්‍යාපෘති 18 ක් අවසන් වී නොතිබූ නමුත්, ඇස්තමේන්තු, ගිවිසුම් සහ තීරණ මත පදනම්ව ගෙවීම් වවුචර් සකස් කර විවිධ ණයහිමි ගිණුමට ඇතුළත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ, ජංගම | විවිධ ණයහිමි ගිණුමට මාරු කරන ලද මුදලින්, 2025 මාර්තු මාසය වනවිට රු. 16,378,952.84 ක ගෙවීමක් සිදු කරන ලදී. ඉන් පසුව විවිධ ණයහිමි ගිණුමේ ඉතිරිව ඇති ශේෂය රු. 352,520 ක් විය. 2025 වර්ෂය සඳහා අවසාන ගිණුම හරහා | කාල පරිච්ඡේදයේ සහතික කරන ලද වැඩවලට අදාල තථ්‍ය බැරකම් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සමුච්චිත අරමුදලට මාරු කිරීමට නියමිත බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ, සභාව සතු කුඩා මංමාවත් 13 ක අලුත්වැඩියා වියදම් එකතුව රු. 2,493,099 ක් මාර්ග අළුතින් ඉදි කිරීම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වත්කම්වල වටිනාකම මෙම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මාර්ග 13 ක් බොරළු ඇතිරීමේ වියදම් හා ප්‍රතිසංස්කරණ වියදම රු.2,493,099 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර ඇති බව. | නඩත්තු කටයුතු පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ, මුද්දර ගාස්තු ලැබීම් රු. 2,439,255 ක් ආදායම් සහ වියදම් ගිණුමේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි. | දෝෂයකින් ප්‍රාග්ධන ආදායම් ලෙස දක්වා ඇති බව. | ආදායම් නිවැරදි වර්ගීකරණය යටතේ හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | පසුගිය වර්ෂ දෙක සඳහා විගණන ගාස්තු ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීමෙන් ආදායම් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | පසුගිය වර්ෂ සඳහා විගණන ගාස්තු ලැබූ විටෙක, ගෙවීම සිදු කිරීම සඳහා 2026 වර්ෂය සඳහා අයවැය මගින් රු. මිලියන 4 ක මුදලක් වෙන් කර ඇති බව. | වියදම් සඳහා වෙන්කිරීම් අදාල කාල වකවානු තුළ සිදුකළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති ඉඩම් 26 ක් සඳහා ඉඩම් ඔප්පු හා පිඹුරුපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | හෙක්ටයාර් 16.17 වපසරියෙන් යුතු ඉඩම් 26 ට පවරා ගැනීමේ නියෝග ලබා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග මහානගර සභාව විසින් සිදු කරනු ලබන බව. | ස්ථාවර වත්කම්වල පැවැත්ම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති වත්කම් හා වගකීම් ශේෂ එකතු වටිනාකම රු. 2,235,521,560 ක් සත්‍යාපනය කිරීමට ප්‍රධාන ලෙජරය සහ පොදු ජ'නල් සටහන් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රධාන ලෙජරය සහ පොදු ජ'නල් සටහන් පවත්වා ගෙනයාම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | විගණනය සඳහා නියමිත ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විෂයන් 02 ක් සම්බන්ධයෙන් ශේෂ පත්‍රයේ සටහන්හි ශේෂ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ශේෂ අතර රු.50,000,000 ක වෙනසක් විය. | ශේෂ පත්‍රය සඳහා වන සටහන්හි දෝෂයකින් රු. මිලියන 25 ක මූල්‍ය ප්‍රතිපාදන වැඩියෙන් සහ සංවර්ධන ප්‍රතිපාදන අඩුවෙන් ද දක්වා කර ඇති බව. | ගිණුම් ශේෂ සැසඳීමක් කර වෙනස්කම් ඇති නොවන පරිදි ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම ප්‍රකාරව අතිරික්තය රු. 6,470,175 ක් වූ නමුත් සමුච්චිත අරමුදලට, එය රු.8,405,963 ක් ලෙස මාරු කිරීම නිසා රු. 1,935,788 ක වෙනසක් විය. | 2024 දෙසැම්බර් 31 දින, සමුච්චිත අරමුදල් නිවැරදි ශේෂය ගැලපීම් මගින් නිවැරදි කර හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ශේෂය දක්වා ඇති බව. | කාල පරිච්ඡේදයට අදාල ආදායම් හා වියදම් ගිණුම ප්‍රකාරව ඇතිවන අතිරික්තය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 අනුකූල නොවීම

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මහානගර සභා ආඥා පනත. (252 අධිකාරය) | | | | |
| (i) | 155 වගන්තිය | - | සභාව සතු කඩකාමර 81 ක් සඳහා අයකරනු ලබන කුලී ගාස්තු සහ ඉඩම් 95 ක් සඳහා අයකරනු ලබන බදු කුලිය කාලීනව තක්සේරු කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් නොලැබීම මත, 2025 සැප්තැම්බර් 12 වන දිනැති ලිපිය නැවත යවා ඇති බව. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | 252 වගන්තිය | 32,707,191 | වරිපනම් බදු නොගෙවන ලද දේපළ හිමිකරුවන්ට එරෙහිව ලිඛිත දැනුම්දීම් සිදුකර අයකළයුතු මුදල් අයකිරීම හෝ දේපළ තහනම් කර ගතයුතු ඉදිරික්‍රියා මාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වන ගිණුමේ දක්වා ඇති පරිදි හිඟහිටි මුදල් රු.32,707,191කින් 2025 නොවැම්බර් 30 දින වන විට රු.8,244,934 ක හිඟ අයකර ඇති බව. | - එම - |
| (ආ) | 1971 අංක 48 දරන පලාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන | - | වරිපනම් බදු අයකිරීම සඳහා මහානගර සභා බල ප්‍රදේශයේ ඇති නිශ්චල දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කළයුතු වුවත්, දේපළ ඒකක 15,340 ක් සඳහා 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන දේපළ බදු අයකර තිබුණි. | 2025 වර්ෂයේ සිට නව තක්සේරු වටිනාකම් මත පදනම්ව වරිපනම් බදු අයකිරීම් සිදු කරනු ලබන බව. | විශේෂ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක | - | මහානගර සභාවට අයත් වාහනවල රාජ්‍ය ලාංඡනය | මේවනවිට වාහන 10 ක රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය | චක්‍රලේඛයට අනුකූලව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කිරීමේ කටයුතු අවසන් කර ඇති බව. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම් චක්‍රලේඛයේ 02(අ) වගන්තිය | - | වර්ෂ 05 සිට 10කට වඩා වැඩි භාවිතයේ නොමැති ධාවනයට නුසුදුසු වාහන 10ක් ඉවත් කිරීමට මහානගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මේ වනවිට නැවතත් වෙන්දේසි කිරීමට සහ අමතර කොටස් ලෙස විකිණීමට මිලගණන් තක්සේරු කිරීමේ කටයුතු සිදුකරනු ලබන බව. | - එම - |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.82,584,388 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මාස 09 කට අදාළව පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.59,851,921ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 23,762,042 | 23,915,922 | 25,291,496 | 32,707,191 | - | 14,343,642 | 14,343,642 | 34,082,765 |
| කුලී | 46,470,285 | 57,970,236 | 53,896,114 | 9,248,506 | - | 35,747,063 | 35,977,491 | 5,174,384 |
| බලපත්‍ර ගාස්තු | 3,030,000 | 3,327,473 | 3,327,473 | - | - | 1,118,150 | 1,118,150 | - |
| වෙනත් ආදායම් | 79,815,500 | 99,493,830 | 99,236,230 | 778,760 | - | 81,204,237 | 81,204,237 | 521,160 |

ඉහත දක්වා ඇති ඇස්තමේන්තුගත ආදායම නගර සභාවට අදාලව සකස් කර තිබුණු අතර මහා නගර සභාවට අදාලව ආදායම ඇස්තමේන්තුගත කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් බදු ලෙස රු. 32,707,191 ක් පැවැති අතර ඉන් රු. 22,336,368 ක හිඟහිටි වරිපනම් බදු වර්ෂ 02 සිට 10 දක්වා කාලයක හිඟ අතර ශේෂ ලෙස පැවැතුණි. | හිඟ අයකිරීම පිළිබඳව, රතු නිවේදන ලබා දීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | වවුනියාව මහානගර සභාවට අයත් කඩකාමර සහ වාහන කුලියට ලබා දීම සම්බන්ධයෙන් කුලීකරුවන්ගෙන් අයකළ යුතු රු. 4,862,119 ක හිඟමුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී සඳහා රතු නිවේදන නිකුත්කර අයකරනු ලබන බව. | - එම - |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉඩම් සඳහා වන හිඟහිටි බදු රු. 2,157,164 ක් පැවැති අතර ඉන් රු. 1,309,097 ක් වූ මුදල වර්ෂ 02 ත් 20 ත් අතර කාල පරාසයක සිට හිඟහිටිව පැවැති අතර එම මුදල අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දින පැවැති හිඟහිටි බදු රු. 1,323,809 කින් 2025 දෙසැම්බර් 31 දිනට රු. 49,214 ක් අයකර ඇති බව. | - එම - |
| (iii) | බද්දට ලබා දෙන ලද ඉඩම්වල බදුකරුවන් විසින් ස්ථිර ගොඩනැගිලි ඉදිකර භාවිතා කරන නමුත් මේ දක්වා ගොඩනැගිලිවලට අදාල වටිනාකම් සැලකිල්ලට නොගෙන ඉඩම්වලට අදාල වටිනාකම් පමණක් තක්සේරු කර ඒ මත පදනම්ව බදු ගාස්තු තීරණය කර තිබුණි. | සභාව විසින් ලබාදෙන ලද දේපළ 95 ක අනවසරයෙන් ඉදිකරන ලද ඉදිකිරීම සම්බන්ධයෙන්, කමිටුවක් පත්කර එමගින් ඉදිරි කටයුතු කිරිමට නියමිත බව. | ඌණතා සම්පූර්ණ කරගෙන ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | මහානගර සභා ආඥා පනතේ 247(අ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදු නොකර වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයවැයට ඇතුලත් කර තිබූ අතර එමනිසා අවසරපත් නොමැතිව ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන ස්ථානවලට එරෙහිව මහානගර සභා ආඥා පනතේ 247(6)4 වගන්තිය ප්‍රකාරව නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | 2026 වසරේ සිට අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර වෙළෙඳ බලපත්‍ර ලබානොගෙන ක්‍රියාකරන අයට විරුද්ධව නඩු පැවරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | පනතේ විධිවිධානවලට අනුගතව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මහානගර සභා ආඥා පනතේ 267 වගන්තිය ප්‍රකාරව, ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් බලපත්‍ර ලබා දීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් ගාස්තු තක්සේරු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු 133 ක් සඳහා බලපත්‍ර නිකුත් කර රැස්කරන ලද ගාස්තු, ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩියෙන් පැවතුණි. | 2026 වර්ෂයේ සිට අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර වෙළෙඳ බලපත්‍ර ලබා නොගෙන ක්‍රියාකරන්නන්ට විරුද්ධව නඩු පැවරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | - එම - |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ** අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 1999 ඔක්තෝබර් 11 දිනැති අංක එල්/ඩී/වීඒ/05/1999 දරන දේපළ මාරු කිරීම යන හිසින් යුතු ලිපිය ප්‍රකාරව, අත්සන් කරන ලද ගිවිසුම් සෑම අවුරුදු 05 කට වරක්ම අළුත්කර දීර්ඝ කර ගතයුතු වුවත්, ඉහත ගිවිසුම්වලට පටහැනිව කඩකාමර 253ක් සහ ඉඩම් 87ක් සඳහා ගිවිසුම් අලුත්කර නොතිබුණි. | දීර්ඝ කාලීන පදනම මත කුලියට ලබා දෙන ලද කඩකාමරවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | වර්ෂ 05කට වරක් බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාවර තැන්පතුවල පැවැති රු.228,317,910 ක ශේෂය පොදු උපයෝගිතා සේවාවන් සඳහා වන සංවර්ධන කාර්යයන්වලට උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් සභාව විසින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | අදාල සියළු තැන්පතු අරමුණු ගතව ස්ථාවර තැන්පතු ගිණුමේ තැන්පත් කර ඇත. එබැවින් ඉදිරි කාලයේදී අදාල අරමුණුගත අවශ්‍යතාවයන් ඇතිවන අවස්ථාවලදී අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීමට තීරණය කර ඇති බව. | අතිරික්ත මුදල් සභාවේ අරමුණුගත කාර්යයන්වල යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | බදු කාලය අවසන්වී වර්ෂ 05 සිට වර්ෂ 10 කට අධික කාලයක් ගතවී තිබූ නමුත්, නිලධාරීන් සිව්දෙනෙකු විසින් භාවිතා කරමින් තිබූ නිල නිවාස 04ක් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල නිවස්වල දැනට ජීවත්වන උපලේඛනගත නොකළ නිලධාරීන් සඳහා 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලයක් ලබා දී අදාල නිල නිවාස සභාව වෙත පවරාගැනීම සඳහා නිර්දේශ කර පැවැත්වීමට නියමිත සහා රැස්වීමට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් බදු අයකරන දේපළ 11,484 කින්, දේපළ 1,276ක් සඳහා K ආකෘති පත්‍ර භාරදී නොතිබුණි. | දැනට සිටින පදිංචි කරුවන්ගේ නම් හා K ආකෘති පත්‍රයේ නම් අතර වෙනසක් පවතින බැවින් එම දැන්වීම් බෙදාහැර නොමැති බව. | K ආකෘති පත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/20 හා 2009 පෙබරවාරි 19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අයකරගත යුතු තානායම් හිඟ කුලිය රු.2,229,222 ක් අය නොවී පැවැතුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 අගෝස්තු මස සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා ගෙවිය යුතු හිඟ රු. 2,229,222 මුදල ගෙවන ලෙස ඉල්ලා නාගරික සංවර්ධන අධිකාරිය වෙත අඛණ්ඩව ලිපි මගින් දැනුම් දී තිබූ බව. | හිඟ කුලිය කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අරමුණින් 2018 වර්ෂයේ රු. 7,230,939 ක් වැයකර ඉදිකර තිබුණු වවුනියාකුලම් සංචාරක මධ්‍යස්ථානය පුද්ගලයෙකුට කුලියට ලබා දී තිබුණද එම බදුකරු විසින් එය අවුරුදු 06 කට අධික කාලයක් මහජන භාවිතයට විවෘත නොකර බදු ගෙවීම් පැහැර හැර තිබුණි. | නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව තීන්දුව ප්‍රකාරව අදාල සංචාරක මධ්‍යස්ථානය භාවිතයට ලබා දීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන බව. | නීතිමය ක්‍රියාමාර්ග සාර්ථකව අවසන් කර හිඟ ආදායම් අයකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිස් ඉඩම් සඳහා වන බදු ගිවිසුමේ 04 වන වගන්තිය ප්‍රකාරව සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව හා නාගරික සංවර්ධන අධිකාරියේ ආඥා පනතට පටහැනිව ඉදිකළ ස්ථිර ගොඩනැගිලි 95 ක් සම්බන්ධයෙන් මහානගර සභා ආඥා පනතේ 42A වගන්තිය ප්‍රකාරව ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මහානගර සභාව විසින් ලබා දෙන ලද දේපළ 95 කින් අවසර නොමැතිව ඉදිකර ඇති ඉදිකිරීම් සම්බන්ධයෙන්, කමිටුවක් පත්කර එමගින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | පනතේ විධිවිධාන පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | කඩකාමර සඳහා වන කුලී ගිවිසුමේ 4 වගන්තිය ප්‍රකාරව සභාවේ පූර්ව අනුමැතියක් නොමැතිව කුලියට ලබාගත් අය අදාල ගොඩනැගිල්ල වෙනත් පුද්ගලයින්ට අයිතිය මාරුකිරීමට හෝ උප කුලී දීමට හෝ නොහැකි වුවත් ගිවිසුමට පටහැනිව සභාවට අයත් කඩකාමර 128 ක් කුලියට ලබාගත් පුද්ගලයන් විසින් තෙවැනි පාර්ශවකරුවන් හට ලබා දී තිබුණි. | දිගුකාලීන කුලී පදනම මත ලබා දෙන ලද කඩකාමරවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | - එම - |
| (ඇ) | නගර සභාවට අයත් පර්චස් 7 ක ඉඩමක් පුද්ගලයෙකු අත්තනෝමතික ලෙස අත්පත් කරගෙන කර්මාන්ත ශාලාවක් | අදාල ඉඩම මහානගර සභාව වෙත පවරා ගැනීම සඳහා වන | මහා නගර සභාව සතු දේපළ අවභාවිතා වීම |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යනු ලබන නමුත්, එම පුද්ගලයාට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන එය ආපසු ලබාගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉල්ලීම් ලිපි ප්‍රාදේශිය ලේකම් වෙත යවා ඇති බව. | වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | අනවසර ඉදිකිරීම් හදුනා ගැනීමට නිසි වැඩපිළිවෙලක් නොතිබූ අතර මහජනතාවගේ පැමිණිලි මත පදනම්ව පමණක් අනවසර ඉදිකිරීම් හදුනාගෙන තිබුණි. එසේම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලේඛනයක්ද පවත්වා නොතිබුණි. | අදාල කරුණ සම්බන්ධයෙන් අවධානය යොමුකර, ඉදිරි කාලයේදී අනවසර ඉදිකිරීම් හදුනා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබා දෙන ලද සංවර්ධන අවසර පත්‍ර 58 සඳහා වන අනුකූලතා සහතික ලබාදී නොතිබුණි. | 2026 වර්ෂයේ සිට පදිංචි සහතික ලබා නොගත් පදිංචිකරුවන් දැනුවත් කිරීමට තීරණය කර ඇති බව. | අදාල පරීක්ෂාවෙන් පසු අනුකූලතා සහතික ලබාදිය යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින ට්‍රැක්ටර් 02ක්, ට්‍රේලර් 11ක්, ටිපර් රථ 03ක්, ගලි බවුසර් 04ක්, බැකෝ ලෝඩරයක් සහ රෝද දෙකේ ට්‍රැක්ටරයක් ආදිය අළුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල වාහන ධාවනයේ යෙදවීම සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අලුත්වැඩියාවන් සිදු කර වත්කම් උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහානගර සභාවල ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය පවතින නමුත් ඒ සඳහා මහානගර සභාව විසින් දිගුකාලීන සැළැස්මක් සකස් කර නොතිබුණු අතර මහානගර සභා බල ප්‍රදේශය තුළ රැස්කරන සියළු අපද්‍රව්‍ය වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයට අයත් පම්බෙයිමඩු ප්‍රදේශයේ විවෘත ස්ථානයේ බැහැර කර ගිනි තැබීම හේතුවෙන් තවත් ප්‍රාදේශීය සභාවක අවට පරිසරයට සිදුවන | වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් එම පරිශ්‍රය අවට වැටක් ඉදිකිරීම අසාර්ථක එකක් බව පවතී. එසේ වුවත්, මෙම කරුණ සම්බන්ධයෙන් මෙහි රාජකාරි ඉටුකරන මුරකරුවන්ට දැනුවත් කිරීම් සිදුකර මෙවැනි ක්‍රියාකාරකම් වලක්වා ගතහැකි සුපරීක්ෂණ කටයුතු සිදුකිරිමට උපදෙස් ලබාදී ඇති බව. තවද අපද්‍රව්‍ය කළමනාකරණ | පරිසරයට හානි සිදු නොවන ආකාරයෙන් කසල කළමනාකරණ කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හානි වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රියාවලිය සඳහා දෛනික සේවක බෙදාහැරීම/ සහභාගීත්වය, ඉඩමක් තෝරා ගැනීම සහ මෙහෙයුම් කටයුතු සිදුකරමින් පවතින බව. | |
| (ආ) | සභාවේ ඝන අපද්‍රව්‍ය මෙහෙයුම්වල නිරත වන සෞඛ්‍ය කම්කරුවන් 43දෙනෙකු සඳහා ආරක්ෂිත කබා සහ සපත්තු භාවිතා කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම, එම සේවකයින්ට වාර්ෂික වෛද්‍ය පරීක්ෂණයන්ද මහානගර සභාව විසින් සිදුකර නොතිබුණි. | එම ආරක්ෂිත කබා රාජකාරි අවස්ථාවලදී භාවිතා කරන ලෙසට අඛණ්ඩව අදාල සේවකයින්ට දැනුවත් කිරිම් සිදුකර ඇති බව. | සෞඛ්‍ය ආරක්ෂිතව අපද්‍රව්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය සිදු කිරීමට උපදෙස් ලබාදිය යුතු අතර කම්කරුවන් නිරන්තර වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කළ යුතුය. |